ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2018

**ESC2219/EPA2419- පූර්ව ළමාවියේ සෙල්ලම්**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2018.12.29 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

**<u>1 වන කොටස</u>**

01. පෙර පාසල් ළමුන් සඳහා ක්‍රියාත්මක කළ හැකි කෙළි සෙල්ලම් පහක් (05) නම් කරන්න.

02. ගවේෂණාත්මක සෙල්ලම් වල හඳුනාගත හැකි ලක්ෂණ දෙකක් (02) ලියන්න.

03. පෙර පාසල් ළමයින් සඳහා පියාජේ විසින් ඉදිරිපත් කරන ලද කෙළි සෙල්ලම් පිළිබඳව න්‍යාය කෙටියෙන් විස්තර කරන්න.

04. දරුවන් විසින් නිවස තුළ භාවිත කළ හැකි ස්වභාවික සෙල්ලම් ද්‍රව්‍ය පහක් (05) සඳහන් කරන්න.

05. පෙරපාසල් ළමයින්ගේ භාෂා හැකියාව සංවර්ධනයට උපකාරී වන සාධක දෙකක් (02) ලියන්න.

06. පෙරපාසල් ළමයින් සඳහා සුදුසු සමාජයීය සෙල්ලම් ක්‍රියාකාරකම් හතරක් (04) ලැයිස්තු ගත කරන්න.

07. රිද්මයානුකූල චලන මගින් පෙරපාසල් ළමයකු තුළ වර්ධනය කළ හැකි කුසලතා මොනවා ද?

08. පෙරපාසල් දරුවන් පංති කාමරය තුළ සෙල්ලම් උපකරණ භාවිත කරන විට පෙරපාසල් ගුරුවරියගේ භූමිකාව කෙටියෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 8 X 5 = 40)

## 2 වන කොටස

09. i. කෙළි සෙල්ලම් යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 04)

ii. පෙරපාසල් අධ්‍යාපනයේ කෙළි සෙල්ලම් වල අරමුණු දෙකක් **(02)** සඳහන් කරන්න. (ලකුණු 06)

iii. එළිමහන් කෙළි සෙල්ලම් උපකරණයක් ලෙස උඩ නැගීමේ රාමුව වැදගත් වන්නේ කුමක් නිසා ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. "සෙල්ලම් ක්‍රියාකාරකම් සඳහා පෙර පාසල් ගුරුවරියගේ පෙර සූදානම අත්‍යාවශ්‍ය වේ."

i. පෙරපාසල් ළමුන් සමඟ සෙල්ලම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරියක මුහුණ දෙන ගැටලු දෙක **(02)** බැගින් උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ඔබ ඉහත සඳහන් කළ ගැටලු අවම කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

11. i. "එළිමහන් සෙල්ලම්" යනු කුමක් ද? (ලකුණු 04)

ii. එළිමහන් සෙල්ලම්වල වාසි දෙකක් **(02)** සුදුසු උදාහරණ සහිතව ලියන්න. (ලකුණු 06)

iii. එළිමහන් සෙල්ලම් පෙරපාසල් ළමයින්ගේ බුද්ධි සංවර්ධනය ඉහල නැංවීමට උදව්වන ආකාරය උදාහරණ මගින් විස්තර කරන්න. (ලකුණු 10)

12. i. හිස්තැන් පුරවන්න. (ලකුණු 06)

| ස්වභාවික සෙල්ලම් උපකරණ | ගෘහස්ත සෙල්ලම් උපකරණ | එළිමහන් සෙල්ලම් උපකරණ |
|---|---|---|
| අ. ................................<br>ආ. ................................<br>ඇ. ................................<br>ඈ. ................................ | අ. ................................<br>ආ. ................................<br>ඇ. ................................<br>ඈ. ................................ | අ. ................................<br>ආ. ................................<br>ඇ. ................................<br>ඈ. ................................ |

ii. පෙරපාසල් ළමයාගේ සංවර්ධනය සඳහා ඉහත සෙල්ලම් උපකරණ වැදගත් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

iii. පෙරපාසල් දරුවන් එළිමහන් සෙල්ලම් උපකරණ භාවිත කරන විට ගුරුවරියගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. i. වයස අවුරුදු 3 ½ - 4 ½ අතර ළමයින් නිරත වන පරිකල්පන සෙල්ලම් හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. පෙර පාසල් ගුරුවරිය විසින් වයස අවුරුදු 3 ½ - 4 ½ අතර ළමයින් තුළ පරිකල්පන සෙල්ලම් ප්‍රවර්ධනය සඳහා යොදා ගත හැකි ක්‍රමෝපායන් සුදුසු උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.